# සංස්කෘතික සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතා

වී.ආර්.වී. සමරදිවාකර[1]

සංචරණය අතීතයේ පටන් සිදුවන ක්‍රියාවලියකි. 1980 දශකයේ සිට විවෘත ආර්ථිකය තුළින් ආර්ථික ක්ෂේත්‍රයේ ඇතිකළ සංවර්ධන ක්‍රියාවලියට සමගාමීව සංස්කෘතික ක්ෂේත්‍රයේ වටිනාකම සංචාරක කර්මාන්තය වෙනුවෙන් යොදා ගැනුණි. ලෝක සංචාරක ව්‍යාපාරයේ ඇස්තමේන්තු පදනම් අනුව ගෝලීය සංචාරක ව්‍යාපාරයේ 37% ක් සංස්කෘතික සංචාරක ව්‍යාපාරය වේ. lonely planet නම් සඟරාව මගින් 2019 වර්ෂයේ ලෝකයේ සංචාරය කිරීම සඳහා සුදුසු රටවල් අතුරින් පළමු තැනට ශ්‍රී ලංකාව නම් කර තිබේ. එසේම යුනෙස්කෝව විසින් ලෝක උරුමයන් ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාන 9ක් නම්කර තිබේ. ලොව සංස්කෘතික සංචාරක ක්ෂේත්‍රයේ භාවිත වන නව ප්‍රවනතා හා සසඳා බලන විට ශ්‍රී ලංකාවේ එම නව ප්‍රවණතා පිළිබඳව හා ඒවා භාවිත කිරීම් පිළිබඳ තවමත් අවධානය යොමු කර නොමැති බව පෙනේ. එම නව ප්‍රවණතා හඳුනාගැනීම හා ඒ ඔස්සේ ආර්ථිකමය වශයෙන් නිසි ඵල ප්‍රයෝජන ලබාගන්නේ කෙසේ ද යන පර්යේෂණ ගැටලු කෙරෙහි මෙහිදී අවධානය යොමු කෙරේ. පර්යේෂණය උදෙසා ෆාහියන්ගල, රජගල ආදී පුරාවිද්‍යාත්මක භූමි කෙරේ අවධානය යොමුකර අධ්‍යයනය සිදුකරන ලදි. ලෝක සංස්කෘතික සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතා හඳුනාගැනීම හා ඒවා ජනතාව අතරට ගෙන යාම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. මේ සඳහා යොදා ගත හැකි ක්‍රමවේද අතර සංස්කෘතික සංචාරක උපායමාර්ග හා සැලසුම් පුළුල් කිරීම, පාරිභෝගික සේවාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම, සංචාරක නිවාඩු නිකේතන තුළ පුරාවිද්‍යාත්මක ස්ථාන අළලා නිර්මාණය කරන ලද වාර්තාමය වැඩ සටහන් විකාශනය කිරීම, පුරාවිද්‍යාත්මක ස්ථානයට අදාළව සිහිවටන ස්මාරක නිර්මාණය කිරීම සහ නිර්මාණශීලී ක්‍රමවේදයන් කෙරෙහි මෙහි දී අවධානය යොමුවිය. සංචාරක වාර සඟරා, අත් පත්‍රිකා ගුවන් යානා හා සංචාරක නිවාඩු නිකේතනයන්ට ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම, උරුම ස්ථානයේ පෙනුමට අනන්‍යතාවයට හානි සිදු නොවන ලෙස සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය සංඥා පුවරු ආදිය භාවිත කිරීම, සංචාරක මාර්ගෝපදේශකයන් හට නිසි පුහුණුවක් හා නිපුනණත්වයක් ලබාදීම. රට පුරා තිබෙන පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳව සංචාරක නිවාඩු නිකේතන දැනුවත් කිරීම හා අදාළ ස්ථාන ඇතුලත් සිතියම් සකස් කොට සංචාරකයින්ට ලබා ගත හැකි ක්‍රියා පිළිවෙතක් සකස් කිරීම, මෙලෙස ලෝක සංස්කෘතික සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතා මෙරට භාවිත කිරීම තුළින් විශාල වශයෙන් සංචාරක ආකර්ෂණයක් හා ආර්ථිකමය වශයෙන් විශාල විදේශ විනිමයක් ද ඉපැයීමේ හැකියාව ලැබේ.

ප්‍රමුඛ පද : සංචාරක කර්මාන්තය, සංචාරක පුරාවිද්‍යාව, රජගල, පුරාවිද්‍යා උරුමය

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය .vihangaravindi97@gmail.com